12

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 74 — 1980 පෙබරවාරි 01 වැනි සිකුරාදා — 1980.02.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය ... | 54 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | 55 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 58 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 61 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


සැ. යු.—(i) සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 1980 ජනවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පලකරන ලදී.

(ii) මෙවර පලවන ගැසට් පත්‍රයේ VI වන කොටසේ ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් පලවේ.

---

**1979 ජූලි මස 06 වැනි දින සිට**

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා බාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන, ගැසට් නිවේදන බාරගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් "විශේෂ නිවේදනය" කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

දනට I කොටසේ (IIඅ) සහ (IIආ) යන ඡේදවලද IV(අ) වැනි කොටසේද පළවිය යුතු දැන්වීම් බාරගන්නා අවසන් දිනය සහ වේලාව ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සතියේ බදාදට පෙර සතියේ බදාදා දහවල් 12ට නියම කර ඇති අතර IV (ආ) වැනි කොටසේ සහ අනිකුත් සෑම කොටසක්ම සඳහා දැන්වීම් බාරගන්නා අවසන් දිනය සහ වේලාව ගැසට් පත්‍රය නිකුත්වන සිකුරාදා දිනට පෙර සතියේ සිකුරාදා දින දහවල් 12ට නියම කර ඇත.

1979 ජූලි මස 06 වැනි දින සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළ කළ යුතු ගැසට් නිවේදන භාරගන්නා වේලාව, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර වැටෙන සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාව ඊට අනුරූපව—එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළකරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගීවීමට ඉඩ ප්‍රස්ථාව සැළසෙන සේ සකස් කරන මෙන් සියළුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

1979 ජූලි මස 06 වන දින පටන්, දැන්වීම් බාරගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් උපලේඛනය ඉහත සඳහන් ආකාරයට සංශෝධනය කරනු ලබන අතර රජයේ මුද්‍රණාලයට එවන සෑම ගැසට් දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනයට සති දෙකකට පෙර—එනම් 1980 පෙබරවාරි 08 වන දින පළ වන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1980 ජනවාරි 25 දින දහවල් 12.00ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

1979 මැයි මස 07 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

53—ශී 73093—10,236 (80/01)

(111) වී. ඒ. මාරිමුත්තු මහතා, අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(112) රණවීර ආරච්චිලාගේ සිරිසේන මහතා, අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(113) හමීඩ් ලෙබ්බේ මොහමඩ් හාදි මහතා, අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(114) නීතිඥ එමානුවෙල් සියල් ජේපල්ඩනෝ මහතා, මන්නාරම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත වරයෙකු වශයෙන් ද,

(115) නීතිඥ ඒ. සී. එම්. යුසුප් මහතා, මාවනැල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

(116) නීතිඥ ප්‍රේමචන්ද්‍ර රණතුංග මහතා, මාවනැල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාම් විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

(117) පියසේන මනම්පේරි මහතා, මුළු දිවයිනෙහි අධිකරණ කොට්ඨාශ සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

කේ. ඩබ්ලිව්. දේවනායගම්,
අධිකරණ ඇමති.

1980 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

2-65/4 —80.02.01 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

## 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත

### 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනතේ 16 'ඇ' ඡේදය යටතේ නියෝගය

ජාතික ලේඛනාරක්ෂක පනතේ 16 'ඇ' ඡේදය යටතේ මහජන යාට රාජ්‍ය ලේඛන බැලීමට අවසර දීම සම්බන්ධයෙන්,, සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති විසින් සාදනු ලැබ, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ නියෝගය.

ඊ. එල්. බී. හුරුල්ලේ,
සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1980 ජනවාරි මස 04 වෙනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනතේ 16 (ඇ) ඡේදය යටතේ සාදනු ලැබ, 1978. 12. 15 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගවල 3(ඇ) ඡේදය පහත සඳහන් ඡේදය ආදේශනය කිරීමෙන් මෙසේ සංශෝධනය කෙරේ.

"(ඇ) මෙහි ඉහත 2 වන ඡේදයේ සඳහන් පනතේ II වැනි ඡේදය යටතේ ආබද්ධවන ලේඛන ආවෘතව ඇති කාලය තුළදී එම ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත්, ඒ සඳහා ලිඛිත අවසරය, පරීක්ෂක කොමිසම් පනත යටතේ හෝ 1978 අංක 7 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසම් පනත යටතේ හෝ පත්කරනු ලබන කොමිසම් පිළිබඳව ඇතිවූ ලේඛන සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ ලේකම්ගෙන් ද, අමාත්‍යවරයෙකු විසින් පත්කරනු ලබන පරීක්ෂණ කමිටු පිළිබඳව ඇතිවූ ලේඛන සම්බන්ධයෙන් ඒ අවස්ථාවේ දී ඊට අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ද ලබාගත යුතුය."

2-137—80.02.01 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 31(9) (ආ) වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කිරීමේ දැන්වීම

1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 31(9)(ආ) වගන්තියෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල යටතේ මෙම දැන්වීමට වන උපලේඛනයේ I තීරුවේ නිශ්චිතව සඳහන් කොට ඇති සහ එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කොට ඇති සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යවසාය මෙම වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යවසායයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. තිලකරත්න,
ලේකම්,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

1980 ජනවාරි මස 10 දින, කොළඹ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| අයිස් නිපදවීම සහ ගබඩා කිරීම සඳහා ශීත කාමර සැප යීමේ ව්‍යවසාය | ... | සී. ස. ඊස්ට් කෝස්ට් අයිස් සප්ලයර්ස් ඇන්ඩ් මැරයින් සර්විසස්. |

2-95—80.02.01 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඩබ්. 105/1400.

## කාර්මික ආරවුල් පනත, 131 වන අධිකාරය

### ආර්. ඇස්. ඇස්. නො. 1 සාමාන්‍ය විකුණුම් මිල ගණන් වලට සම්බන්ධයෙන් වූ 1970 අංක 2 දරන සාමූහික ගිවිසුම

එක් පාර්ශ්වයක් වශයෙන් ලංකා කම්කරු සංගමය සහ අනික් පර්ශ්වය වශයෙන් ලංකා වතු හිමියන්ගේ සම්මේලනය අතර ඇතිවූ, 1970 මැයි මස 22 දිනැති අංක 14,907 දරන ලංකා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1970 අංක 2 දරන සාමූහික ගිවිසුමේ 4 වගන්තිය අනුව වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස් වරයා විසින් 1979 නොවැම්බර් තුල නැව් ගත කරන්නන්ට කොළඹ දී ගෙවනු ලැබූ ආර්. ඇස්. ඇස්. නොම්මර 1 සඳහා සාමාන්‍ය මාසික මිල ගණන් රාත්තලකට රු. 4/29.10 ශත බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. එල්. බී. කේ. පෙරේරා,
කම්කරු කොමසාරිස්.

1980 ජනවාරි 09,
කොළඹ 5, කම්කරු මහලේකම් කාර්යාලයේ,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

2-41—80.02.01 දින අංක 74 දරණ ගැසට් පත්‍රය